මගේ අංකය : JSC/SEC/CIR-L/2025

සියළුම මහේස්ත්‍රාත්වරුන් වෙත,

<u>මහේස්ත්‍රාත් අධිකරණයන්හි පවරා ඇති නඩු සඳහා අධිකරණයන්හි තැන්පත් කරන මුදල්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත ලබා ගැනීමේදී ඇතිවන අපහසුතා වලක්වා ගැනීම</u>

ශීර්ෂගත කරුණට අදාලව සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරී සෝමසිරි ඒකනායක මහතා විසින් අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරන ලද අංක: ETFB/LG/MIS/2025/08 හා 2025.07.07 දිනැති ලිපිය හා සබැඳිව අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය විසින් මා වෙත යොමු කරන ලද අංක: MOJ/SEC/01/JSC/2025 හා 2025.08.12 දිනැති ලිපිය හා බැඳේ. (අදාල ලිපි වල පිටපත් මේ සමඟ අමුණා ඇත)

02. ඒ පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත ලැබිය යුතු මුදල්, ප්‍රමාදයකින් තොරව හා කාර්යක්ෂමව එම මණ්ඩලය වෙතට යොමු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට ඔබට දැන්වීමට මට නියම කර ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2025 ඔක්තෝබර් මස 13 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දීය.

# සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
# ஊழியர் நம்பிக்கைப் பொறுப்பு நிதியச் சபை
# EMPLOYEES' TRUST FUND BOARD

මහල් 19-23 "මෙහෙවර පියස" 19 முதல் 23 வரை மாடி "மெகெவர பியெஸ" 19-23 Floors "Mehewara Piyesa"
තැ.පෙ 807, නාරාහේන්පිට, කොළඹ 05. அஞ்சல் பெட்டி எண். 807, நாரஹென்பிட்டி கொழும்பு 05. P.O.Box 807 ,Narahenpita .Colombo 05.


මගේ අංකය / எனது இலக்கம் / My Number } ETFB/LG/ MIS /2025/08

ඔබේ අංකය / உமது இலக்கம் / Your Number

RECEIVED
Secretary's Office
Ministry of Justice and National Integration
15 JUL 2025
9.45 AM / PM NO: 153

2025.07.07

ලේකම්,
අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය,
අංක 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

මහත්මයාණෙනි/මහත්මියෙණි,

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් මහේස්ත්‍රාත් අධිකරණයන්හි පවරා ඇති නඩු සඳහා අධිකරණයට ගෙවනු ලබන මුදල් මණ්ඩලය වෙත ලබා ගැනීමේ දී සමහර අවස්ථා වලදී සිදුවන අපහසුතාවයන් වළක්වා ගැනීම.**

මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයේ දී භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්, අජිත් අබේසේකර මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද 2025 වර්ෂයේ පළමුවන විගණන හා කළමණාකරණ කමිටු රැස්වීමේදී "උසාවිවලට අය වී ඇති සාමාජික මුදල් ලබාගෙන සාමාජික ගිණුම් වලට බැර කිරීමේ ප්‍රගතිය" පිළිබඳව සාකච්ඡා කරනු ලැබීය.

එහිදී, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත යටතේ ගෙවිය යුතු දායක හා අධිභාර මුදල් ගෙවීම පැහැරහැර ඇති සේවායෝජකයින්ට එරෙහිව සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් මහේස්ත්‍රාත් අධිකරණයන්හි නඩු පවරනු ලබන බවත් එකී නඩු වෙනුවෙන් අදාල සේවායෝජකයින් විසින් අධිකරණයේ තැන්පත් කර ඇති මුදල් අදාල අධිකරණයන් විසින් මණ්ඩලය වෙත ලබා දුන් පසුව මණ්ඩලය විසින් එම නඩු වලට අදාල මුදල් අදාළ සාමාජිකයින්ගේ ගිණුම් වලට බැර කර අදාල හිමිකම් ඉල්ලීම් ඉදිරිපත් කළ පසුව ඔවුන් වෙත නිදහස් කරනු ලැබීම සාමාන්‍යයෙන් සිදු වන බව පැහැදිලි කරනු ලැබීය. එසේ වූවද සමහර අවස්ථා වලදී ඇතැම් මහේස්ත්‍රාත් අධිකරණයන්ගෙන් විවිධ හේතු මත එම මුදල් මණ්ඩලය වෙත යොමු කිරීමේ ප්‍රමාදයක් ඇති වී තිබෙන බව එම සාකච්ඡාවේදී නිරීක්ෂණය විය. සමහර අවස්ථා වලදී මණ්ඩලයට යොමු කල යුතු මුදල් ප්‍රමාද දෝෂයකින් වෙනත් රාජ්‍ය ආයතන වෙත යොමු කර තිබීම හේතුවෙන් එම මුදල් එම ආයතන වලින් නැවත ගෙන්වා ගැනීමට සිදු වීම, එසේම මාසිකව අධිකරණය වෙත වගඋත්තරකරුවන් විසින් ගෙවීම් කරන මුදල් මාසිකව නොව මාස කිහිපයක් ප්‍රමාද වී යොමු කිරීම යනාදී හේතුන් මත මෙම ප්‍රමාදයන් සිදු වන බව නිරීක්ෂණය වී ඇත.

එහිදී ඉහත කී පරිදි මණ්ඩලය විසින් පවරා ඇති නඩු වෙනුවෙන් අධිකරණයන්හි තැන්පත් කර ඇති සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් නැවත මණ්ඩලය වෙත කාර්යක්ෂමව ලබා ගැනීම සම්බන්ධයෙන් සමහර අවස්ථා වලදී සිදු වී ඇති අපහසුතාවයන් පිළිබඳව සැලකිල්ලට ගෙන ඒ බව සඳහන් කරමින් එවැනි අපහසුතාවයන් වළක්වා ගැනීම සඳහා අධිකරණ අමාත්‍යාංශය හරහා සියලුම මහේස්ත්‍රාත් අධිකරණ දැනුවත් කිරීමේ ලිපියක් නිකුත් කිරීම සුදුසු බවට යෝජනා විය.

මෙම කාරණය සම්බන්ධයෙන් ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කර ඉහත සඳහන් පරිදි සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් පවරනු ලැබ ඇති නඩු වෙනුවෙන් මහේස්ත්‍රාත් අධිකරණයන්හි තැන්පත් කර ඇති අරමුදල් අපහසුතාවයකින් තොරව කාර්‍යක්ෂමව නැවත සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත ලබා ගැනීමට හැකි වන පරිදි මහේස්ත්‍රාත් අධිකරණ කාර්යාලයන්හි අදාල නිළධාරීන් දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නේ නම් අතිශය කෘතඥ වෙමු.

මෙයට - විශ්වාසී,
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙනුවට,

සෝමසිරි ඒකනායක
සභාපති/ප්‍රධාන විධායක නිළධාරී


ප්‍රධාන කාර්යාලය/பிரதான காரியாலயம்/Head Office
TEL :(+94)112 581 704 / 0117 747 200
FAX :(+94)112 503 917
Web :www.etfb.lk

සහන පියෙස/ "சகன பியெஸ"/ Sahana Piyesa
Tel/Fax : (+94)117 747 827
E-mail:mgrclm@etfb.lk